

# අඳුන් සිහින 5

හේමමාලා හේරත් ලියන නවකතාව

රිදීමා, විශාල සාප්පු සංකීර්ණයේ වූ කුඩා ඉන්දියානු කඩයට ගොඩවූයේ, සුවඳ දුම්කූරු හා ඉටිපන්දම් ගැනීම සඳහාය. කිසිදු බඩුවක් නොගත්තත්, එහි වූ විවිධ ඉන්දියානු නිමැවුම් දෙස බැලීමට ඈ ආශා කළාය. එහි අයිතිකාරිය වූ තරබාරු ඕස්ට්‍රේලියානු ගැහැණිය, දිගු වර්ණවත් සායක් හා ඊට කැපෙන බ්ලවුසයකින් සැරසුණු තරුණිය දෙස බැලුවේ, ඇය පැමිණියේ මොන රටෙන්දැයි සිතීමට තැත් කරමිනි. ඉන්දියාව, පකිස්තානය, ඉරානය, සමහර විට නැගෙනහිර යුරෝපීය රටකින් වුවද, වෙන්නට බැරි නැත. ඇය තම හිස මඳක් සෙලවූයේ, උදෑසනම ප්‍රහේලිකා විසඳීමට තරම් උද්යෝගිමත් මනසක් තමා සතු නොවූ නිසාය. උරහිසෙහි වූ දිගු පටියකින් එල්වුණු කුඩා බෑගයක්, අතෙහි දවටා සිටි තද පැහැති ජම්පරයත්, පිට දිගට වැටෙනා කරලට ගෙතූ කෙස් කළඹත් නිසා රිදීමා කුඩා සාප්පුව තුල වූ විදේශීය භාණ්ඩ හා මනාව ගැලපුණාය. එමෙන්ම බිත්තියෙහි එල්වා තිබූ ඉන්දීය නාට්‍යාංගනාවකගේ මනහර දසුනක් ද මවා පෑවාය. එම චිත්‍රයට සමාන තරුණිය තමා ළඟට එනතුරු අයිතිකාරිය ඒ නොදැක්කාය.

රිදීමා, තම බඩුවලට අයවිය යුතු මුදල ගෙවුවේ, මඳ සිනහවකුත් පාමිනි. බඩු දැමූ බෑගයත් රැගෙන එළියට බට ඇය, ඊට ඇතුල් වූ තරුණයාගේ ඇඟේ හැපී, නෙවැටී බේරුණේ අනූනවයෙනි.

"රිදීමා....."
"දිනූෂ....."

දිනූෂ සිනාසෙන විට, ඔහුගේ කපොලක සුළියක් තිබුණාදැයි රිදීමාට මතකක් නොවීය.

"කොහෙද මේ ?" දිනූෂ ඇසීය. රිදීමා තමා අත වූ බෑගය පෙන්වූවා ය.
"බඩු වගයක් ගත්තා. !"
"දැන් කෙළින්ම ගෙදර යනවද ?"
"ඔව් !...."

"පොඩ්ඩක් ඉන්න. මමත් අම්මට ඉටිපන්දම් වගයක් ගන්න ආවා.... සුපර් මාර්කට්වල මෙච්චර ඉටිපන්දම් තියෙද්දි අපේ අම්මට ඉටිපන්දම් ඕනි මෙතනින්මයි...."
"මෙතන ඒවා හරි සුවඳයි...." රිදීමා පැවසුවාය.

තමාගේ උරිස් සෙලවූ දිනූෂ කඩයට ගොඩ වැදුණේ, හැකි ඉක්මනින් හැරී ආවේය.
"මේක දුන්න හැටියේ මමත් ආපහු යුනි එකට යනවා. එන්න ! මම ඔයාව ඩ්‍රොප් කරන්නම්...."
"අනේ නෑ. මම බස් එකේ යන්නම්." රිදීමා පැවසුවාය.

"බයවෙන්න දෙයක් නෑ. අපේ ගෙවල් මේ ළඟ...."
රථ ගාලේ සුදු පැහැති වාහනයට හේත්තු වී ඔවුන් දෙස බලා සිටි තරුණයාගේ දෑස අසතුටින් කුඩාවෙනුද, ඔහුගේ ගැට ගැසූ පෝනිටේලයේ කෙස් මඳ සීත සුළඟට විසි-රයනුද, වේගවත් හුස්මෙන් ලය උස්පහත්වෙනුද ඔවුහු නොදුටුවෝය.
දිනූෂගේ කාරයේ යන ගමන් රිදීමාට සිතුණේ, ඔහු හොඳ ළමයෙක් බවෙකි. ඔහු රටේ ඇති, නැති සෑම දෙයක් ගැනම කථා කළේය. එහෙත් අජය ගැන අසන්නට ගිය සෑම වතාවකම ඔහු ඒ කතාව මග ඇරියා යැයි ඇයට සිතුණේය.

දිනූෂගේ නිවස සමාන වූයේ කුඩා මාළිගාවකටය. දෙමහල් නිවස වටා වූ අලංකාර උද්‍යානය උයන්පල්ලෙකුගේ සහාය ඇතිව සැකසුණු එකකැයි රිදීමා කල්පනා කළාය.

"බහින්න...."
දිනූෂගේ කපොල වළ ගැසිණි. රිදීමා සුන්දර සිනාවක් පෑවාය.
විවර වූ දොරින් දිස්වූ මධ්‍යම වයසේ ගැහනිය, අතීතයේ රූමතියකවූ බවට සාධක තවමත් දක්නට ලැබුණේය. උස්, සිහින් ඇයද රිදීමා මෙන්ම සායකින් හා අත්දිග බ්ලවුසයකින් සැරසී, කෙටි, රැළි කෙස් කළඹ ගෙල මුලට ගැට ගසාගෙන උන්නාය. ඇගේ කපොලද, දිනූෂගේ මෙන්ම සිනාවෙන් වළ ගැසිණි.

"මේ කවුද පුතා ?"
"මගේ යාළුවෙක් ! රිදීමා, මේ මගේ අම්මා... අම්මා මේ රිදීමා" දිනූෂ පැවසුවේය.

මවගේ මුහුණ කුතුහලයෙන්ද, මවිතයෙන්ද, ප්‍රීතියෙන්ද වෙනස් වී යන සැටි රිදීමා දුටුවාය.
"එන්න දුව ඇතුලට...."

නිවස ඇතුල්වන තැනම, ශාලාව දෙපසින් වූයේ, උඩුමහලට නගිනා, මහා තරප්පු පේළි දෙකකි. පැරණි වටිනා රාමුවකින් සැරුසණ කණ්නාඩියකි. දෙපසින් ලොකු මල් බඳුන් දෙකක් වූ අතර පිඟන් ගඩොල් ඇල්ලූ පොළව දිලිසුණේය.
"දූවිලි පොදක්වත් දකින්නට නෑ.' රිදීමාට සිතුණේය.

"එන්න රිදීමා..."
චම්පස වූ දොරකින් දිනූෂ, ඇය ඇතුළට කැඳවාගෙන ගියේය. එහි වූ සෑම බඩු මුට්ටුවකින්ම පැවසුණේ, නිවසෙහි අයිතිකරුව-න්, ධනවත් සුඛෝපභෝගී දිවියක් ගෙවන්නවුන් බවෙකි.

රිදීමා අසලින්ම ඉඳගත් මව ඇගේ විස්තර ඇසුවාය.

"අද නම් රිදීමාට ගැලවිල්ලක් නෑ...."
දිනූෂද, පසෙක වූ පුටුවක දිගා වූයේය.
"ඒත් අම්මා අපි ඉක්මනින් යන්න ඕනෑ..."

"කොහේදිද දුවට පුතාව හම්බ උණේ ?" දිනූෂට පිළිතුරක් නොදීම මව විමසුවාය. තමා දිනූෂගේ පෙම්වතිය යැයි ඇය සැක කරනවාදැයි සිතීමෙන් රිදීමාට දැනුණේ මහත් අපහසුවකි.

"මෙයත් මෙයාගේ යාළුවොත් අජයව හොඳට දන්නවා. මමත් අඳුන ගත්තෙ අජයගෙන්...."

මව දෑස් කුඩා කළාය. "අජය ?" ඇය විමසුවේ සැක සහිතවය. ඊ ළඟට ඇය සිතනු ඇත්තේ තමා අජයගේ පෙම්වතිය ලෙස යැයි රිදීමා බිය වූවාය.

"දුව ලංකාවේ කොහෙද ?" රිදීමා තමාගේ ගම ගැන විස්තරයක් කළාය. ඇය කළ විස්තර අනුව, මව සෑහිමකට පත්වන්නාක් මෙන් ඇයට දැනුණේය.

"අපේ ගමත් ඊට ටිකක් කිට්ටුව..... දුව දන්නවද දන්නේ නැහැ. ඉස්සර නම් මුළු ගමම අපේ. දැන් තමයි පිට මිනිස්සු ඒ ගම්වලට ඇවිත් පදිංචි වෙලා ඉන්නේ. ඒවා අපේ පරම්පරාවේ අයට රජ්ජුරුවන්ගෙන් තෑගි ලැබුණු නින්ද ගම්....."

"හා ! හා ! එනපොට නම් හොඳ නැහැ....."
දිනූෂ අසුනින් නැගිට්ටේ ය. මම ගිහින් තේ ටිකක් හදාගෙන එන්නම් !"

'දිනූෂ හරි හොඳයි. එයයි එයාගේ අප්පච්චීයි ගෙදර වැඩට හරියට උදව් කරනවා....."
රිදීමාගේ දෑසේ වූ ප්‍රශ්නය දුටු මව සිනා පෑවාය.
"දිනූෂාගේ අප්පච්චිත් ඩොක්ටර් කෙනෙක්. මේ ළඟ වැඩ කරන්නේ. දවාලට කෑම කන්න එයි....."

මව නැවත ගම පිළිබඳ මාතෘකාවට බැස්සාය.
"ආ...හරි.....හරි..... මට දැන් මතකයි, ඔය කියන ගම ළඟට තමා අර බෙර ගහන මිනිස-"සුන්ගේ ගම තියෙන්නෙ." ඈ පැවසුවාය.
"මම දන්නවා....."

'බෙර ගහන මිනිස්සු ?" රිදීමා කල්පනා කළාය.
"ඒ ගමේ අය තමා, තාම නුවර පෙරහැරේ බෙර ගහන්නේ. ඒ හන්දා තමයි මාළිගාවෙන් ඔය ගම තෑගි ලැබුණේ...."

මව යළිත් සිනහවක් පෑවාය. "ඉස්සර නම් ඔය මිනිස්සුන්ට උඩ ඇඳුමක් අඳින්න අයිතියක් තිබුණේ නෑ. ඒත් දැන් නම් මඟුල් ගෙවල්වලට නිළමේ ඇඳුම තමා අඳින්නේ.!"

දැරියක මෙන් හඬ නගා සිනාසුණු ඇගේ වදන්වල අපහාසයකට වඩා වූයේ උපහාසයකැයි රිදීමා දුටුවාය.

"අපේ ගම්වලට ඔය කවුරුත් ආවේ ගියේ නැහැ රාජකාරියකට ඇරෙන්න..... ඒත් දැන් අපේ මෝඩ මිනිස්සු, සල්ලිවලට ඔය හැම තැනිනන්ම මඟුල් තුලා කරගන්නවා...."
රිදීමා දෑස් මහත් කොට මව දෙස බැලුවාය.

"උඹ හිතුවද මිනිහෝ බෙර කාරයෙකුගේ පුතෙකුට මගේ දුව දීග දෙයි කියලා ?"
අප්පච්චී ගිගරුවේ, මුළු ගම්මානයටම ඇහෙන්නටය.

"ඇඟිල්ලේ හැටියට ඉදිමෙන්න දැන ගනින් !
පිටුපා සිටි අප්පච්චීට මුවාවී සිටීමෙන්, ඔහු කෑගස්සේ කාහට දැයි රිදීමාට නොපෙනුණේය.

